# මිරිදිය මත්ස්‍ය වගාවෙන් ඔබට අතිරේක ආදායමක්

පොකුණුවල මසුන් ඇතිකිරීම අඩු වියදමක් යොද පටන් ගත හැකි කුඩා කර්මාන්තයකි. මෙයින් තමන්ගේ කෑම සඳහාත්, විකිණීම සඳහාත් පහසුවට සහ ලාබයටත් මසුන් ලබා ගැනීමට පුළුවන්. ගෙවල්වල කුකුළන්, හරකුන්, ඌරන් ඇතිකරනවා වගේම මසුන් ඇති කිරීම ද ලෙහෙසි පහසු කාර්යයක්. ඒ සඳහා වැය කිරීමට සිදු වන වියදමද එතරම් විශාල නොවේ.

ආර්ථික වාසිය සඳහා මසුන් ඇති කිරීම අප රටට අළුත් දෙයක්. එහෙත් ලෝකයේ විවිධ රටවල ජනයා මෙය කර්මාන්තයක් වශයෙන් කරගෙන යති. ඔවුන්ගේ මෙම මාළු ගොවිපලවල් රැක බලා ගැනීම හා නඩත්තු කිරීම ද පවුලේ උදවියගේ කටයුත්තක් වේ. විශාල වශයෙන් ව්‍යාප්ති නොවූව ද, අප රටේද ඇතැම් ප්‍රදේශවල ජනයා මසුන් ඇතිකිරීම කර්මාන්තයක් වශයෙන් ආරම්භ කර ඇති බව දක්නට ලැබේ.

මේ ලිපියෙන් උත්සාහ ගනු ලබන්නේ මසුන් ඇතිකිරීමේ කර්මාන්තය සඳහා ඔබට ද පිවිසීම සඳහා අවශ්‍ය මූලික දැනුමක් ලබා දීමටයි.

පළමුවෙන්ම මාළු පොකුණක් සාද ගන්නා ආකාරය පියවරෙන් පියවර සලකා බලමු. මේ සඳහා සුදුසු බිමක් තෝරා ගත යුතු වන අතර පොකුණ පිළිවෙලට සකස් කිරීම සහ සාරවත් කිරීම කළ යුතු වේ. පොකුණට හොඳ ජල සැපයුමක් ලබා දිය යුතුය. පසුව පොකුණට සුදුසු මසුන් බහාලිය යුතුවන අතර පොකුණ රැකබලා ගැනීම සහ අස්වැන්න ලබා ගැනීම මෙම කර්මාන්තයේ ප්‍රධාන වැඩකටයුතු වේ.

**මාළු පොකුණ සඳහා**
**බිමක් තෝරා ගැනීම**

ජලය පහසුවෙන් ලබා ගත හැකි බිමක් මේ සඳහා තෝරාගත යුතුය. ඒ අනුව ඇලක්, දෙලක් හෝ ගඟක් කිට්ටුවෙන් තිබෙන ඉඩමක් වඩා හොඳයි. මෙම කර්මාන්තයේදී ජලය ලබා ගැනීම සහ පාලනය කර ගැනීම වැදගත් වේ. උදාහරණයක් හැටියට පහසුවෙන් ජලය ලබාගත හැකි වගුරු, ගංගා මෝයවල් අසල පහත් බිම් සහ වගා කිරීමට නොහැකි අත්හැර දමන ලද ඉඩම් පෙන්වා දිය හැක.

මෙම බිමෙහි පස මැටි හා ලෝම් සහිත පසක් නම් ජලය රඳා පවතින අතර මසුන් ද හොඳින් වැඩේ. වැලි සහ ගල් සහිත පසක වතුර රඳා පවතින්නේ නැති අතර මසුන් ද හොඳින් නොවැඩේ. තවද මෙම බිම් ගංවතුරට යටවී නොවීම සහ බෑවුම සහිත වීම උචිතය.

පොකුණු සෑදීමට යන මුදල සහ එය නඩත්තු කිරීමට යන මුදල ඔබ තෝරා ගන්නා බිම් මත රඳා පවතී. ඒ නිසා ඉහත දක්වා ඇති ලෙස සුදුසු බිමක් තෝරා ගත් විට මේ සඳහා වියදම් වන මුදල් අඩුකර ගැනීමට පුළුවන.

**පොකුණු සෑදීම**

පටන් ගැනීමේදී කුඩා ප්‍රමාණයේ පොකුණකින් ආරම්භ කිරීම වඩා පහසු විය හැක. පර්චස් දහයක (10) පමණ නැත්නම් අක්කර දහසයෙන් පංගුවක (1/16) ප්‍රමාණයේ හරි හතරැස් පොකුණක් හෝ පොකුණු කීපයක් සුදුසු වේ.

* පළමුවෙන් තෝරා ගත් බිමේ පර්චස් 10 ක් නැත්නම් අක්කර 1/16 ක ප්‍රමාණය හෝ ඊට වැඩි ප්‍රමාණයක් පිහිටි ප්‍රදේශයේ සීමාව සලකුණු කරගන්න. එම ප්‍රදේශයේ තණකොළ, ගස් පඳුරු ඉවත්කොට උඩ පස් තට්ටුව කපා වෙන්කර ගන්න.
* පොකුණේ බැම්ම ඉදිකරන ප්‍රදේශයේ ගල් සහ මුල් කැබලි සියල්ල ඉවත් කර හොඳ පස් තට්ටුව දක්වා පිරිසිදු කරන්න.
* පොකුණ සෑදීමේදී ලබා ගත් පස් යොදා තද කරමින් බැම්ම සකස් කරන්න. බැම්ම සේදියාම වැළැක්වීම සඳහා එහි මුදුනේ සහ දෙපැත්තේ තණකොළ පිඩැලි අතුරන්න.
* පොකුණ අඩි 5 සිට 8 අතර ප්‍රමාණයකට ගැඹුරු කරන්න.
* මුලින් ඉවත් කරන ලද පස් තට්ටුව පොකුණ පතුලේ අතුරන්න.

පොකුණට හෝ බැම්මට සිමෙන්ති යෙදීම අවශ්‍ය නැත. පොකුණ වටේ ගස් වැවීම සුදුසු නොවන අතර, පොකුණ හැකි පමණ ආලෝකයට විවෘත කරන්න.

**ජලය ලබාගැනීම**

පොකුණට ජලය ලබා ගැනීම සඳහා නළ සවි කළ යුතුය. සාමාන්‍යයෙන් උණ බම්බු, මැටි පයිප්ප, පුළුවන් නම් ජල නළ මේ සඳහා යොද ගත හැක. ඇළකින් දෙලකින් හෝ ගඟකින් ජලය ලබා ගන්නේ නම් නල මඟින් කෙලින්ම ලබා ගැනීම කළ හැක. පොකුණට වැඩියෙන් එකතුවන ජලය පිටවීමටත්, අවශ්‍ය අවස්ථාවලදී පොකුණ හිස් කළ හැකි වීම සඳහාත් මෙම නල උපකාරී වේ. සාමාන්‍යයෙන් පොකුණේ ජල මට්ටම අඩි 4 සිට 6 දක්වා තිබීම සුදුසුය.

පොකුණට ජලය වැටෙන්නේ ගඟකින් හෝ දිය පාරකින් නම් වැඩි ජලය ගලා ඒම වැළැක්වීමට සුදුසු පරිදි තැනූ ගේට්ටුවක් අවශ්‍යයි.

පොකුණ සකස් කිරීම සහ ජලය පාලනය පිළිබඳ සියළු උපදෙස් ධීවර මධ්‍යස්ථානවලින් විමසා ලබා ගත හැක.

**පොකුණු සාරවත් කිරීම**

ගොම පොහොර, ඌරන් සහ කුකුළන්ගේ මලපහ, වියලි තණකොල හෝ කොම්පෝස්ට්, සුපර් පොස්පේට් පොහොර පොකුණේ වතුර සාරවත් කිරීම සඳහා යොද ගන්නා දේවල්ය.

මෙය සිදු කරන්නේ මෙසේය.

* කලින් සඳහන් කරන ලද පර්චස් 10 හෝ අක්කර 1/16 ක ප්‍රමාණයේ පොකුණකට සුපර් පොස්පේට් කි.ග්‍රෑ. 2 1/2 ක් පමණ හෝ වියලි ගොම වර්ග, වර්ග අඩි 1 ට රාත්තල් 1 ක් පමණ පොකුණ පතුලේ කීප තැනක ගොඩ ගහන්න. හැකිනම් මේ සමඟ අළුහුණු මිශ්‍ර කරන්න.
* දැන් පොකුණේ අඩි භාගයක් (1/2) ක් පමණ ගැඹුරට ජලය පුරවා සති දෙකක් පමණ තිබෙන්නට හරින්න.
* පසුව පොකුණට අවශ්‍ය උපරිම ජල මට්ටම එනම් අඩි 4-6 දක්වා පුරවන්න. මේ කාලය තුළ ජලය පලාවන් පැහැති වේ.
* දැන් පොකුණ මත්ස්‍ය වගාවට ලෑස්තියි.

* හැකි නම් සතියකට එක්වරක් බැගින් කොළ පොහොර හෝ ගොම පොහොර හෝ දමන්න.

* මෙසේ කිරීමෙන් මසුන්ට ජලයෙන් ලැබෙන ආහාර ප්‍රමාණය වැඩි වේ.

**පොකුණේ ඇතිකිරීමට සුදුසු මසුන් තෝරා ගැනීම**

ඇතිකිරීම සඳහා වඩාත් සුදුසු මසුන් වර්ග ධීවර අමාත්‍යාංශයේ ධීවර මධ්‍යස්ථාන වලදී බෝකර නොමිළේ හෝ පහසු මිළට දෙනු ලැබේ. මෙම මසුන්ගේ ලක්ෂණ දැනගැනීම ප්‍රයෝජනවත් වේ. එවිට ඔබේ ප්‍රදේශයට ගැලපෙන මසුන් ඔබට තෝරා ගැනීමට හැකි වේ.

**පොකුණුවල දැනට වගාකර ඇති මසුන් සහ ඔවුන්ගේ ලක්ෂණ**

කොරලි, රද්දිල්ලා, වෛරමා, කාප් මාළුන්, ගුරාමි, වෙක්කයා, ගොඩයා, හිරිකනයා, මල් කොරලි, කැට්ලා සහ රෝහු යන මාළු වර්ගයන් ලංකාවේ පොකුණුවල ඇතිකිරීම සඳහා යොදා ගෙන ඇති අතර ඔවුන්ගෙන් හොඳ අස්වැන්නක් ද ලබාගෙන ඇත.

දිවයිනේ එක් එක් ප්‍රදේශවල සාර්ථකව වගාකළ හැකි මසුන් වර්ග වෙනස්වන බැවින් ඔබේ ප්‍රදේශයට සුදුසු මසුන් පිළිබඳ විස්තර ධීවර මධ්‍යස්ථාන නිලධාරීන්ගෙන් ලබා ගැනීමට පුලුවන.

**මසුන් පොකුණට දැමීම**

පොකුණ පොහොර දමා සරු කර සතියකට පමණ පසු සෙ.මී. 5 සිට සෙ.මී. 7 (අඟල් 2 - 2 1/2) දක්වා ප්‍රමාණයේ මාළු පැටවුන් එහි බහාලිය හැක. මොවුන් නොමිළේ හෝ පහසු මිළට ධීවර මධ්‍යස්ථානයෙන් ලබා ගැනීමට පුළුවන. සාමාන්‍යයෙන් පර්චස් 10 ක පමණ (අක්කර 1/16) පොකුණක මාළු පැටවුන් 125 - 200 සංඛ්‍යාවක් ඇති කළ හැක.

**මසුන්ට කෑම දැමීම හා රැකබලා ගැනීම**

මේ සඳහා හාල්නිවුඩු, පොල් පුන්නක්කු, මයියොක්කා කොළ සහ අල, පටපණු පිලවුන් මස් කඩවල අපතේ යන ද්‍රව්‍ය, ඉවත දමන ලද එළවළු සහ පළතුරු, මෘදු පලා වර්ග, තණකොළ, කුස්සියේ ඉතිරි වන අපතේ යන ද්‍රව්‍ය යොදා ගත හැක. මේවා පහසුවෙන් ලබා ගත හැකි ලාභ ආහාර ද්‍රව්‍ය වේ. ඇතිකරනු ලබන ඒ ඒ මත්ස්‍ය විශේෂිතය අනුව ඔවුන් ගන්නා ආහාර වෙනස් විය හැක. මේ සමඟ ඇති සටහනින් ඒ පිළිබඳව ඔබට අවබෝධයක් ලැබිය හැක. (සටහන සඳහා 21 වන පිටුව බලන්න.)

කෑම අවශ්‍ය ප්‍රමාණයට පමණක් පොකුණට දමන්න. කෑම දැමීම එකම වේලාවකදී සිදු කරන්න. පොකුණ ගැන සෑම විටම සැලකිලිමත්ව සිටින්න. පොකුණේ දල් ආවරණ, ජල මට්ටම ගැන සොයා බලන්න. ජලයේ පැළෑටි වැඩීමට ඉඩ නොහරින්න.

**මත්ස්‍ය අස්වැන්න ලබාගැනීම**

මසුන් දැමීමෙන් මාස 6 - 8 කට පමණ පසු මසුන් සෑහෙන්න වැඩී ඇත. දුන් මාළුන් ඇල්ලීමට පුළුවන. මේ සඳහා අතංගුවක් පාවිච්චි කර වරින්වර අල්ලා ගත හැක. මීට අමතරව දැලක් හෝ බාල්දියක් යොදගත හැක.

පොකුණේ මාළු සම්පූර්ණයෙන්ම අල්ලා ගැනීමට අවශ්‍ය නම් බැම්මේ කොටස් කපා දැලකින් ආවරණය කර පොකුණ හිස් කළ හැක. මෙහිදී කුඩා පැටවුන් සහ ලොකු මාළුන් වෙන් කරන්න. කුඩා පැටවුන් වෙනත් ටැංකියකට මාරු කරන්න.

අස්වැන්න සම්පූර්ණයෙන් ලබා ගත් පසු පොකුණ සම්පූර්ණයෙන් වියලා මඩ ඉවත් කොට, බැම් අලුත්වැඩියා කර, පොකුණට කලින් මෙන් නැවත පොහොර දමා, ජලයෙන් පුරවා, අවශ්‍ය ප්‍රමාණයට මාළු පැටවුන් දමා කර්මාන්තය ඉදිරියට ගෙන යන්න.

**කර්මාන්තයට යන වියදම්**

පර්චස් 10 ක එනම් අක්කර 1/16 ක ප්‍රමාණයේ පොකුණක් ගොඩනැගීම සඳහා යන වියදම රුපියල් 5,000 (පන් දහසක්) පමණ වේ. මීට අමතරව නිරන්තරයෙන් වන සංසරණ වියදම් (එනම් හුණුවලට, ගොම පොහොරවලට, මාළු, පැටවුන්ට, හාල් නිවුඩු සහ පුන්නක්කු වලට) ඇතුළු අනෙකුත් වියදම් රු.1000 කින් පමණ සම්පූර්ණ කර ගත හැක. ඒ අනුව මෙවැනි කර්මාන්තයක් ආරම්භ කිරීම දුෂ්කර නොවේ.

**කර්මාන්තයෙන් ලැබෙන වාසි සහ ප්‍රයෝජන**

* මිරිදිය මසුන් බෝහෝ ගුණදායක නිසා මුහුදු මසුන් නොලැබෙන ගම්බද ජනතාවට මෙය එලදායී කර්මාන්තයක් වේ. තවද ඔබේ ගෙදරට අවශ්‍ය අළුත්මාළු ඔබේ ගෙවත්තෙන්ම ලබා ගැනීමට හැකි වීම මුදල් ඉතිරි කර ගැනීමකි. වැඩිපුර ලැබෙන මාළු විකුණා ගැනීමෙන් අමතර ආදායමක් ලබා ගත හැක.

* වෙනත් වගාවකට යොද ගත නොහැකි, අත්හැර දමන ලද ඉඩමක හෝ වගුරු බිම් ප්‍රදේශයක හෝ ඔබේ ගෙවත්තේ දැනටමත් තිබෙන පොකුණක හෝ මෙය ආරම්භ කිරීමෙන් බොහෝ ප්‍රයෝජන ලැබේ.

* ඔබේ ගෙවත්තේ කුකුළන්, ඌරන්, තාරාවන් සහ ගවයින් ඇති කරන්නේ නම් එම සතුන්ගේ කුඩු පොකුණ කිට්ටුවෙන් සාද ගන්න. කුකුල් සහ තාරාවන්ගේ කුඩු පොකුණට උඩින් සකස් කිරීමට ඔබට පුළුවන් නම් ඔවුන් සඳහා වෙන් කිරීමට සිදුවන ඉඩ ප්‍රමාණය ඉතිරිවන අතර, මෙම සතුන් පාවිච්චියට ගෙන ඉතිරි වන වැඩි ආහාර සහ ඔවුන්ගේ මළ පහ ජලයට වැටීමෙන් මත්ස්‍ය ආහාර ද වැඩි වෙයි. මෙයින් මත්ස්‍ය අස්වැන්න වැඩි කර ගත හැක.

* තව ද පොකුණේ බැම්මේ එළවළු ලෙස කන්කුන්, ගොටුකොළ වැනි පලා වර්ග වැවීමෙන් ඒවා එදිනෙද කෑම වේලට ලබාගත හැකිවාක් මෙන්ම විකුණාගත හැකි නම් අමතර ආදායමක් ද ලබා ගැනීමට පුළුවන්.

* පොකුණු අස් කිරීමෙන් පතුලේ ඉතුරු වන මඩ එළවළු හා පළතුරු වගාවන්ට කදිම පොහොරක් ලෙස යොද ගැනීමට ද පුළුවන.

* තවද පහසුවෙන් එදිනෙද සොයා ගැනීමට පුළුවන් හාල් නිවුඩු, පුන්නක්කු, මඤ්ඤොක්කා, කොළ සහ අල, පටපණු පිලවු, ඉවත දමන එළවළු සහ පළතුරු, ලා දළු, තණකොළ මාළුන්ට ලබා දීමෙන් කෑම වලට යන අධික වියදම් ප්‍රමාණයන් බොහෝ දුරට අඩු කර ගත හැක.

* හොඳ ජල සැපයුමක් සහිත සුදුසු බිමක් තෝරා ගැනීමෙන් පොකුණ ගොඩනැගීමට යන වියදම අඩුකර ගන්න පුළුවන්. එපමණක් නොව පොකුණේ සියළු පාලන, නඩත්තු කටයුතු, සඳහා පවුලේ ශ්‍රමය ද යොදා ගැනීමට හැකි වනවා ඇත.

* පොකුණේ ප්‍රමාණය විශාල කිරීමෙන් බහාලිය හැකි මාළු ප්‍රමාණය වැඩිවන අතර ලබාගත හැකි මාළු අස්වැන්නේ ප්‍රමාණය හා ආදායමද වැඩිය.

**කර්මාන්තයට අවශ්‍ය කාර්මික උපදෙස්**

මෙම මාළු වගාව පිළිබඳව සියළුම කාර්මික උපදෙස් සහ තොරතුරු මිරිදිය ධීවර මධ්‍යස්ථාන මගින් නොමිලේ ලබා දේ.

**කර්මාන්තයට අවශ්‍ය සහය**

වගාකරුවන්ට අවශ්‍ය මාළු පැටවුන් ලබා දීම සහ අවශ්‍ය ස්ථාන කරා ගෙනයාම ධීවර මධ්‍යස්ථාන මගින් කරදෙනු ලැබේ.

දිවයිනේ පිහිටා ඇති ධීවර මධ්‍යස්ථාන ධීවර අමාත්‍යාංශය යටතේ පිහිටා ඇත. උඩවලව්, මුරුතවෙල, ඉගිනියාගල, බෙරගල, ගිනිගත්හේන, නුවරඑළිය, රම්බඩගල්ල, දඹුල්ල, පොලොන්නරුව, පදවිය, පනාපිටිය, යන ස්ථානවල මිරිදිය ධීවර මධ්‍යස්ථාන පිහිටා ඇති අතර, පම්බල හා පිටිපන කිවුල්දිය ධීවර මධ්‍යස්ථාන පිහිටා ඇත. ගාල්ල, අනුරාධපුරය සහ මාන්කුලම් හි මිරිදිය ධීවර ව්‍යාප්ති මධ්‍යස්ථාන පිහිටා ඇත.

මෙම මධ්‍යස්ථානවල නිලධාරීන් විසින් මත්ස්‍ය වගාවට අදල සියළුම සේවා කටයුතු ඉටු කරනු ලැබේ. ඔබ මෙම මධ්‍යස්ථානවලට ආසන්න ප්‍රදේශයක ජීවත් වේ නම් එම අදල මධ්‍යස්ථානයේ උපදෙස් ලබා ගෙන මෙම කර්මාන්තය ආරම්භ කරන්න පුළුවන්.

**මිරිදිය මසුන් හඳුනා ගන්න....................**

| මාළු වර්ගය | හොඳින් වැඩෙන ප්‍රදේශ | ගන්නා ආහාර වර්ග | පොකුණකට (පර්චස් 10) එක් වරකට දැමිය හැකි මාළු පැටවුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| කොරලි | පහත් බිම් ප්‍රදේශ මිරිදියේ මෙන්ම කරදියේ ද වැඩේ. මාස 6-8 කාලයකදී ග්‍රෑම් 250–350 දක්වා වැඩේ. | ඕනෑම දෙයක් ආහාරයට ගනී. | |
| වෛරිමා | වේගයෙන් වැඩේ මාස 6–8 කාලයකදී ග්‍රෑම් 115–250 ක් වේ. විශාල වශයෙන් පැතිර ඇත. | ජලයේ කුඩා ශාක කොටස් | සෙ.මී. 5–7 ප්‍රමාණයේ පැටවුන් 200 ක් පමණ |
| රද්දිල්ලා | මාස 6-8 කදී ග්‍රෑම් 250–300 අතර දක්වා වැඩේ. | | |
| **කාප් මාළුන්:** සාමාන්‍ය කාපයා | උස් බිම්වල හොඳින් වැඩේ. මාස 8-10 කදී ග්‍රෑම් 250-500 ප්‍රමාණයකට වැඩේ. | ශාක හා සත්ව කොටස් | පැටවුන් 300 ක් පමණ |
| තණකොල කාපයා | පොකුණුවල පහසුවෙන් වැඩේ. කඳුකර ප්‍රදේශවල වැඩීම අඩුය. මාස 8 කදී කි.ග්‍රෑ. 1 සිට 1.5 දක්වා වැඩේ. | තණකොල වර්ග | පැටවුන් 200 ක් පමණ |
| හිස ලොකු කාපයා | පොකුණුවලදී මාස 6–8 කාලයකදී කි.ග්‍රෑ. 1 සිට 1.5 දක්වා වැඩේ. | ජලයේ කුඩා සත්ව කොටස් | පැටවුන් 200 ක් පමණ |
| ගුරාමි | පහත් බිම් ප්‍රදේශවල මාස 6- 8 කදී ග්‍රෑම් 500-750 දක්වා වැඩේ. | ශාක කොටස් | |
| වෙක්කයා | කිවුල් දියේ වැඩිපුර වැඩේ. මිරිදියේ වැඩේ. මාස 6–8 දක්වා කාලයකදී ග්‍රෑම් 115–250 ක් දක්වා වැඩේ. | ජලයේ ශාක හා සත්ව කොටස් | සෙ.මී. 5.7 ප්‍රමාණයේ පැටවුන් 200 ක් පමණ |
| ගොඩයා | කිවුල් දිය පොකුණුවලට සුදුසුයි. මාස 6–8 දක්වා කාලයකදී ග්‍රෑම් 115–250 ක් දක්වා වැඩේ. | ජලයෙන් ආහාර ලබා ගනී. | |